# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, ප්‍රථම වසර - 2019

## නීති විධික්‍රම

(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 07

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

01. 'සමාජය හැඩගැස්වීමට සහ මිනිසුන්ගේ හැසිරීම විධිමත් කිරීමට මාධ්‍යයක් ලෙස නීතිය භාවිත කරනු ලබයි. එය, නීතියේ සහය මගින් මානව හැසිරීම් පාලනයට ගත් උත්සාහයකි.'

උක්ත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නෙහිද? ඕනෑම නීති ගුරු කුල දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර ප්‍රායෝගික උදාහරණ සමගින් තහවුරු කරන්න.

02. "අපගේ එදිරිවාදී අපරාධ යුක්තිය පසිඳලීමේ පද්ධතිය තුළ, තමාට නීතිඥයෙකුගේ සේවය ලබා ගැනීමට නොහැකි තරම් දිළිඳු, අධිකරණය තුළට රැගෙන එන ඕනෑම පුද්ගලයෙකුට, ඔහු වෙත නීතිඥ සහාය ලබා නොදෙයි නම් සාධාරණ නඩු විභාගයක් තහවුරු කළ නොහැක යන්න පිළිගැනීම සඳහා අප විසින් හේතු සහ ආවර්ජනය අවශ්‍ය වේ."

Black J in *Gideon vs Wainwright* (1963) 372 US 335.

යුක්තිය සහ සාධාරණ බව අභියෝගයට ලක් කරන එදිරිවාදී පද්ධතියේ ප්‍රධාන ගුණාංග ඇසුරින් උක්ත ප්‍රකාශයේ වලංගුභාවය විවේචනාත්මකව අගයන්න. යුක්තිය පසිඳලීමේ විමර්ශනවාදී පද්ධතිය යටතේ තත්ත්වය සමඟ ඔබගේ පිළිතුර සසඳන්න.

03. ව්‍යවස්ථා අර්ථ නිරූපණයේ අරමුණ වන්නේ ව්‍යවස්ථාවේ භාවිත වී ඇති වචන තුළින් ව්‍යවස්ථාදායකයේ චේතනාව අනාවරණය කරගැනීමයි.

ඔබගේ පිළිතුර නඩු තීරණ නීතිවිද්‍යාව සහ ප්‍රායෝගික උදාහරණ ඇසුරින් සනාථ කරමින් උක්ත ප්‍රකාශය ව්‍යවස්ථා අර්ථ නිරූපණ රීති ඇසුරින් සාකච්ඡා කරන්න.

04. A, B සහ C යන කරුණු මත පදනම් වූ නඩුවක්, ශ්‍රී ලංකා අභියාචනාධිකරණයේ ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ විභාග වෙමින් පවතියි. ඔබගේ පිළිතුර සනාථ කිරීමට අදාළ අධිකාරීන් උපුටා දක්වමින් පහත නඩු තීන්දුවල අදාළත්වය සාකච්ඡා කරන්න:

අ) A, B සහ C යන කරුණු මත පදනම්ව 2011 වසරේ දී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පූර්ණ විනිශ්වාසනයක් විසින් ලබා දුන් තීරණයක්;

ආ) A, B, C සහ D යන කරුණු මත පදනම්ව ශ්‍රී ලංකාවෙන් ඉදිරිපත් වූ අභියාචනයකට ප්‍රිවි කවුන්සිලය ලබා දුන් තීරණයක්;

ඇ) A, B සහ C යන කරුණු මත පදනම්ව ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය 2004 වසරේ දෙසැම්බර් මස ලබා දුන් තීරණයක්; සහ

ඈ) A, B සහ C යන කරුණු මත පදනම්ව ශ්‍රී ලංකාවේ අභියාචනාධිකරණයේ ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලයක් විසින් 2018 වසරේ දී ලබා දුන් තීරණයක්.

05. සිලැන්ඩ් යනු බහුතරයක් ශාකි ප්‍රජාව වන බහු සංස්කෘතික රටකි. එම රටෙහි පසුගිය වසර 300ක් තිස්සේ ජීවත්වන සිල්ලු ජන වර්ගයද සැලකිය යුතු සුළුතර ජනගහනයක් ද වෙයි. දිගුකාලීන සම්ප්‍රදායක් වශයෙන්, සිල්ලු ප්‍රජාවේ කාන්තාවන් විසින් මුහුණු ආවරණයක් පැළඳීම අවශ්‍ය කරන චාරිත්‍රයක් සිල්ලු ප්‍රජාවේ කාන්තාවෝ අනුගමනය කරති. ප්‍රසිද්ධ ස්ථානවල සම්පූර්ණ මුහුණු ආවරණය කිරීම තහනම් කරන සහ නීතියෙන් බැහැර කරන 'ප්‍රසිද්ධ ස්ථානවල සම්පූර්ණ මුහුණු ආවරණය තහනම් කිරීමේ පනත' 2019 මැයි මස සිලැන්ඩ් නීතිගත කරයි. පනතේ 2 වන වගන්තිය මඟින් ප්‍රසිද්ධ ස්ථානවල සම්පූර්ණ මුහුණු ආවරණය තහනම් කරන අතර රු. 15,000 දඩයක් සහ/හෝ මාස 6 දක්වා සිර දඬුවමක් පනවයි.

2019 අප්‍රේල් මස අග සිදු වූ අන්තවාදී ත්‍රස්ත ප්‍රහාර මාලාවකින් පසුව, ත්‍රස්තවාදය සහ ආරක්ෂාවට තර්ජන ඇතිවීමේ පසුබිම තුළ, අවශ්‍ය ආරක්ෂක ක්‍රියාමාර්ගයක් ලෙස නව නීතිය ක්‍රියාවට නැංවීම රජය සාධාරණීකරණය කළේය. පසුගිය ඔක්තෝබර් මස, සිල්ලු කාන්තාවන් දෙදෙනෙක් ප්‍රසිද්ධියේ මුහුණු ආවරණයක් පැළැඳ සිටීම මත පනතේ 2 වන වගන්තිය යටතේ අත්අඩංගුවට ගෙන චෝදනා ගොනු කෙරිණි. කාන්තාවන් දෙදෙනා *දැඩිව තර්ක කර සිටියේ මුහුණු ආවරණය පැළඳීම ඔවුන්ගේ ම තේරීමක් බවත්* එය ඔවුන්ගේ සංස්කෘතිය සමඟ සමීපව බද්ධ වී ඇති ගැඹුරින් මුල් බැසගත් සම්ප්‍රදායක් බවත්ය. සිල්ලු ප්‍රජාවේ ආගමික නායකයන් තවදුරටත් තර්ක කර සිටින්නේ මුහුණු ආවරණය, ශ්‍රද්ධාව සහ භක්තිය සංකේතවත් කරන බවත් එය කාන්තාවන් සහ පිරිමින්

අතර වෙන් කර හඳුනා ගන්නා උපායක් සහ පිරිමින්ගේ ලිංගික ආශාවන් පාලනය කිරීමේ මාර්ගයක් බවත්ය.

චාරිත්‍රයේ වලංගුතාවය පිළිබඳව ඔබගේ උපදෙස් අපේක්ෂා කරයි. සීලැන්ඩ්හි නීති පද්ධතිය, ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට සමාන යැයි උපකල්පනය කරමින් ඔබගේ උපදේශය ලියා දක්වන්න.

06. “21 වන සියවසේ විකල්ප ආරවුල් නිරාකරණය (ADR): අනාගත අපේක්ෂාවන්, අභියෝග සහ ශ්‍රී ලංකාව සඳහා ඉදිරි ගමන් මග” යන තේමාව යටතේ අධිකරණ අමාත්‍යාංශය විසින් සංවිධානය කරන සම්මේලනයක ලිපියක් ඉදිරිපත් කිරීමට ඔබට ආරාධනා කරනු ලැබේයැයි උපකල්පනය කරන්න.

සම්මේලනයේ තේමාව සමඟ ගැලපෙන ලෙස ලිපිය කෙටුම්පත් කරන්න.

07. ‘නීති වෘත්තිකයන්ගේ වෘත්තීය ප්‍රමිතීන් ක්‍රමයෙන් පිරිහෙමින් පවතින බවට නීති වෘත්තිය තුළ සැලකිල්ලට භාජනය වී තිබේ.’

උක්ත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නෙහිද? ශ්‍රී ලංකාවේ නීතිඥයන්ගේ වෘත්තීය ආචාර ධර්ම රීතීන් සහ වගකීම් ඇසුරින් විවේචනාත්මකව සාකච්ඡා කරන්න. ප්‍රායෝගික උදාහරණ සහ නඩු තීන්දු නීතිය ඇසුරින් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

*****